

# සතර පාරාජිකා විනිශ්චය

පෙළ සහිත

# සතරපාරාජිකා විනිශ්චය.

භාවසන්නය සහ

හෙරණසික, දිනචරියාව, සතරසංවරසීලය

යනමෙයින් යුක්තයි.

මෙම ග්‍රන්ථය

එක්තරා ස්වාමීන්වහන්සේනමක් ලවා
සංග්‍රහ කරවාගෙණ

ඇම්. දියෝනිස් ප්‍රනාන්දුවන

මාවිසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ අච්චුකන්තෝරුවෙහි

මුද්‍රනය කරවාප්‍රසිද්ධ කරණලදී.

ශ්‍රී බුද්ධවර්ෂ 2440.

1897.

# චතුපාරාජිකා විනිච්ඡයො.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

මනුස්සා මනුස්ස තිරච්ඡාන ගතභූතා තිස්සො ඉත්ථියො හොන්ති, තාසං වච්චමග්ග පස්සාවමග්ග මුඛමග්ග වසෙන තයො තයො කත්වා නව මග්ගා, තථා මනුස්සාමනුස්සතිරච්ඡාන ගතූභතොබ්‍යඤ්ජනානං. මනුස්සා මනුස්ස තිරච්ඡානගතභූතා තයො පුරිසා හොන්ති, තෙසං වච්චමග්ග මුඛමග්ග වසෙන ද්වෙ ද්වෙ කත්වා ඡ මග්ගා. තථා මනුස්සාමනුස්ස තිරච්ඡානගතානං තිණ්ණං පණ්ඩකාන'න්ති එවංවාදසන්නං සත්තානං තිංසමග්ගා හොන්ති. තෙසු අඤ්ඤතරස්මිං මග්ගෙ පිලොතිකාදිසන්ථතෙ වා අසන්ථතෙ වා පකතිවාතෙන අසම්ඵුට්ඨෙ අල්ලොකාසෙ සික්ඛං අපච්චක්ඛිකො භික්ඛු එකතිලබීජමත්තම්පි අත්තනො අඞ්ගජාතං සන්ථතංවා අසන්ථතං වා සෙවනචිත්තෙන පවෙසෙය්‍ය පාරාජිකො හොති. සාසනතො චුතො'ති වෙදිතබ්බො.

**සඞ්ඛෙපෙනායං පඨමපාරාජික විනිච්ඡයො නිට්ඨිතො.**

---

පරසන්තක'න්ති ජානිත්වා පාදං වා පාදාරහවත්ථුං වා ථෙය්‍යචිත්තෙන පඤ්චවීසති අවහාරෙසු එකෙනෙව අවහාරෙන අවහරති පාරාජිකා. තත්ථ පාදාරහං නාම පඤ්චගුඤ්ජා මත්තං සුවණ්ණං.

**කතමෙ පඤ්චවීසති අවහාරා?** නානාභණ්ඩපඤ්චකං, එකභණ්ඩපඤ්චකං, සාහත්ථිකපඤ්චකං, පුබ්බපයොගපඤ්චකං, ථෙය්‍යාවහාරපඤ්චක'න්ති පඤ්චපඤ්චකවසෙන පඤ්චවීසති අවහාරා වුත්තා.

**තත්ථ කතමං නානාභණ්ඩපඤ්චකං?** ආදියෙය්‍ය හරෙය්‍ය අවහරෙය්‍ය ඉරියාපථංවිකොපෙය්‍ය ඨානාචාවෙය්‍ය'ති ඉමෙ පඤ්ච.

**තත්ථ ආදියෙය්‍යාති?** අඤ්ඤස්ස ආවාසාදීනි ගහෙතුං අභියුඤ්ජන්තස්ස සබ්බකායවචීපයොගෙසු දුක්කටං, සාමිකස්ස විමතිං උප්පාදෙති ථුල්ලච්චයං, න දදාමීති අත්තනො ධුර නික්ඛෙපෙන න මය්හං භවිස්සතී'ති සාමිකස්ස ධුරනික්ඛෙපෙන ච පාරාජිකං. එකෙන පන ධුරනික්ඛෙපෙ අකතෙ න හොති, අච්ඡින්දිත්වා ඨපිතවත්ථුතො පාදග්ඝනකවත්ථුං ථෙය්‍යචිත්තෙන අවහරෙය්‍ය පාරාජිකං. **හරෙය්‍යා'ති,** අඤ්ඤස්ස පරික්ඛාරං ග

හෙත්වා ගච්ඡන්තො ථෙය්‍යචිත්තෙන පරාමසෙය්‍ය දුක්කටං, ඵන්දාපෙය්‍ය ථුල්ලච්චයං, ඨානාචාවෙය්‍ය පාරාජිකං.

**අවහරෙය්‍යා**'ති, අඤ්ඤස්ස අත්තනො සන්තිකෙ ඨපිතපරික්ඛාරං සාමිනා දෙහි'ති වුත්තෙන න ගණ්හාමී'ති, වදෙය්‍ය අදින්නාදානස්ස පුබ්බපයොගත්තා දුක්කටං, සාමිකස්ස විමතිං උප්පාදෙය්‍ය ථුල්ලච්චයං නෙවදදාමී'ති අත්තනොධුරනික්ඛෙපෙන ච න ලභාමී'ති සාමිකස්ස ධුරනික්ඛෙපෙන ච පාරාජිකං. එකෙන පන ධුරනික්ඛෙපකෙන න හොති.

ඉරියාපථං විකොපෙය්‍යා'ති, සහභණ්ඩහාරකෙන ගණ්හිස්සාමී'ති, ථෙය්‍යචිත්තෙන ඉරියාපථං විකොපනෙ පයොගෙ දුක්කටං, පඨමපාදවාරං අතික්කාමෙය්‍ය ථුල්ලච්චයං, දුතියපාදවාරං අතික්කාමෙය්‍ය පාරාජිකං. ඨානාචාවෙය්‍යා'ති, අඤ්ඤස්ස පරික්ඛාරං ථෙය්‍යචිත්තෙන පරාමසෙය්‍ය දුක්කටං, ඵන්දාපෙය්‍ය ථුල්ලච්චයං, ඨානාචාවෙය්‍ය පාරාජිකං. සවිඤ්ඤාණකාවිඤ්ඤාණකමිස්සකත්තා.

ඉදං නානාභණ්ඩ පඤ්චකං නාම.

**කතමං එකභණ්ඩපඤ්චකං?** ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍යා, ති ඉමෙසු පඤ්චසු සවිඤ්ඤාණකවත්ථුස්මිං යෙව ගහිතෙ එකභණ්ඩ පඤ්චකං නාම.

**කතමං සාහත්ථිකපඤ්චකං?** සාහත්ථිකො, ආණත්තිකො, නිස්සග්ගියො, අත්ථසාධකො, ධුරනික්ඛෙපො'ති, ඉමෙ පඤ්ච.

කථං සාහත්ථිකො'ති,? පරභණ්ඩස්ස සහත්ථා ථෙය්‍යචිත්තෙන ගහණං, ආණත්තිකො'ති, අසුකස්ස භණ්ඩකං ථෙනෙත්වා ගණ්හාහී'ති, අඤ්ඤස්ස ආණාපනං, නිස්සග්ගියො'ති, සුංකගහණට්ඨානතො අඤ්ඤස්ස භණ්ඩං, අසුකස්මිං ඨානෙ ගතෙ සති ගණ්හිස්සාමී'ති, පරිකප්පිතට්ඨානතො වා බහිනිපාතනං, අත්ථසාධකො'ති, අසුකස්ස භණ්ඩං අසුකස්මිං ඨානෙ ථෙනෙත්වා ගණ්හාහී'ති, අඤ්ඤස්ස ආණාපිතෙ නසක්කොම්'ති, වුත්තෙ යදා සක්කොසි තදා ගණ්හාහී'ති, ආණාපෙති සො එකනෙතන අවහරිස්සති ආණාපකස්ස ආණත්තික්ඛණෙ යෙව පාරාජිකං, ඉතරස්ස ගහිතක්ඛණෙ පාරාජිකං. අපරස්ස තෙලකුම්භියා පාදග්ඝනකං තෙලං අවස්සං පිවනකානි උපාහනාදීනි ථෙය්‍යචිත්තෙන පක්ඛිපත් හත්ථතො මුත්තමත්තක්ඛණෙ යෙව පාරාජිකං.

**ධුරනික්ඛෙපො**'ති, ආරාමාදීනි අභියුඤ්ජනට්ඨානෙපි අත්තනො අත්තනො සන්තිකෙ ඨපිතපරික්ඛාරං මයා න ගහිත'න්ති මුසාකත්වා ගණ්හනට්ඨානෙපි තාවකාලිකං ගහෙත්වා අදින්නට්ඨානෙපි තං විනාසං පාවෙය්‍ය න දම්මී'ති, අත්තනො ධුරනික්ඛෙපෙන න ලභාමී'ති, සාමිකස්ස ධුරනික්ඛෙපෙන ච පාරාජිකං, එකෙනාපන ධුරනික්ඛෙපෙ අකතෙ න හොති.

### ඉදං සාහත්ථිකපඤ්චකං නාම.

**පුබ්බපයොගපඤ්චකං** නාම පුබ්බපයොගො, සහපයොගො, සංවිදාවහාරො, සඞ්කෙතකම්මං නිමිත්තකම්ම'න්ති, ඉමෙපඤ්ච කථං පුබ්බපයොගො'ති? අසුකස්සභණ්ඩං ථෙනෙත්වා ගණ්හාහී'ති, ආණාපෙති ආණත්තො අවස්සං ගණ්හිස්සති ආණාපකස්ස ආණත්තක්ඛණෙ පාරාජිකං, ආණත්තස්ස පන ගහිතක්ඛණෙ පාරාජිකං.

අත්ථසාධකපුබ්බපයොගම්පි වජ්ජයොභූමිනානයෙන දට්ඨබ්බො.

ආණාපිතස්සගහණතො පුබ්බෙයෙව ආණාපකස්සපාරාජිකත්ථං සිද්ධිතො අත්ථසාධකොනාම පුබ්බපයොගොපිනාම. සහපයොගො'ති, අක්ඛෙත්තං ආරාමඛෙත්තාදි භූමිනං අභිරෙකගහණස්සකරණපයොගෙ සති අවසානපයොගෙන සහ පාරාජිකං, තම්පි උග්ගිණ්හතං ධුරනික්ඛෙපෙන හොති. **සංවිදාවහාරො'ති**, අසුකස්සභණ්ඩං ථෙනෙත්වා ගණ්හාමා'ති, අඤ්ඤෙහි සද්ධිං සංවිදහිත්වා ගච්ඡන්ති එවං සංවිදහිත්වා ගච්ඡන්තානං එකො තං භණ්ඩං ඨානාචාවෙති සබ්බෙසම්පි පාරාජිකං. සඞ්කෙතකම්ම'න්ති, පුබ්බණ්හාපරණ්හාදිකාලෙසු අසුකස්සභණ්ඩං අසුකස්මිංඛණෙ ථෙනෙත්වා ගණ්හාහී'ති වුත්තො සචෙ සඞ්කෙතං අවිරාධෙත්වා ථෙනෙත්වා ගණ්හාය්‍ය සඞ්කෙතකාරකස්ස සඞ්කෙතකරණක්ඛණෙ පාරාජිකං, ගාහකස්ස ගහිතක්ඛණෙ පාරාජිකං. **නිමිත්තකම්ම'න්ති**, අක්ඛිනිඛණහනුකුක්ඛිපනාදිං කත්වා අසුකස්සභණ්ඩං ථෙනෙත්වා ගණ්හාහී'ති, වුත්තො විය නිමිත්තං සඤ්ඤං කරොති කතනිමිත්තසඤ්ඤං අවිරාධෙත්වාගණ්හාය්‍ය නිමිත්තකාරකස්ස නිමිත්තක්ඛණෙ පාරාජිකං, ගාහකස්ස ගහිතක්ඛණෙ පරාජිකං.

### ඉදංපුබ්බපයොගපඤ්චකංනාම.

කතමං ථෙය්‍යාවහාරපඤ්චකං? ථෙය්‍යාවහාරො, පසය්හාවහාරො, පරිකප්පාවහාරො, පටිච්ඡන්නාවහාරො, කුසාවහාරො'ති ඉමෙපඤ්ච. කථං ථෙය්‍යාවහාරො'ති? උම්මග්ගඛණනාදිවා තුලාකූටමානකූටාදි වඤ්චනකිරියාය වා කූටකහාපණාදි පරිවත්තනෙන වා වඤ්චෙත්වා ගණ්හාය්‍ය පාරාජිකං.

පසය්හාවහාරො'ති, ගාමඝාතකාදයො විය පරායත්තං බලක්කාරෙන ගණ්හාය්‍ය වා ගහෙතබ්බං බලිග්ගාමභොජකරාජභටාදයො විය ච අධිකං වා ගණ්හාය්‍ය පාරාජිකා.

**පරිකප්පාවහාරො'ති**, ථෙය්‍යත්ථාය අනොනාගබ්භං පවෙසෙත්වා සචෙ වත්ථං භවිස්සති ගණ්හිස්සාමි සචෙ සුත්තං න ගණ්හිස්සාමි ති පරිකප්පෙත්වා පසිබ්බකං ගණ්හාය්‍ය තස්මිං වත්ථං හොති ඨානාචාවනෙ පාරාජිකං, සචෙ සුත්තං හොති රක්ඛති,

සුත්තභාවං ජානිත්වා යං ලද්ධං තං ගහෙතබ්බ'න්ති, ගහෙත්වා
සචෙ ගච්ඡති පඨමපදවාරෙ ථුල්ලච්චයං දුතියපදවාරෙ පාරාජි
කං, භූමියං ඨපෙත්වා සුත්තභාවං ජානිත්වා ගණ්හෙය්‍ය ඨානාචා
වෙති පාරාජිකං. සුත්තභාවස්ස අජානනක්ඛණෙ චොරොසි
චොරොසී'ති, අනුබන්ධන්තෙනස්සු ඡඩ්ඩෙත්වා පලායති නත්ථි
පාරාජිකං, සබ්බපයොගෙ දුක්කටං, ඡඩ්ඩිතං භණ්ඩසාමිකා දිස්වා
ගණ්හෙය්‍යුං සාධු අඤ්ඤො දිස්වා ගණ්හෙය්‍ය භණ්ඩදෙය්‍යං,
සචෙ අඤ්ඤොපි න ගණ්හාති සාමිකාපි ධුරනික්ඛෙපං අකත්වා
ගතා හොන්ති පුන සො ආගන්ත්වා ථෙය්‍යචිත්තෙන ඨානාචා
වෙති පාරාජිකං. පගෙවෙතං මයා ගහිතං මම දානි සන්තක'න්ති
සකසඤ්ඤාය වා පංසුකූලසඤ්ඤාය වාපි ගහිතෙ අනාපත්ති,
භණ්ඩදෙය්‍යං පන හොති. ධුරනික්ඛෙපං කත්වා ඡඩ්ඩිතභණ්ඩ
මපි ගණ්හයස්ස ගණ්හාපෙය්‍ය මෙවහොති තස්මා අත්තනො
පයොගෙන ගහෙත්වා ඡඩ්ඩිතත්තා, භණ්ඩදෙය්‍යං න තදෙව
භණ්ඩං වා දාතබ්බං භණ්ඩග්ඝණකමූලංවා දාතබ්බං, අයං භණ්ඩ
පරිකප්පො නාම. එකො අඤ්ඤෙසං පරික්ඛාරං ගහෙත්වා අසු
කට්ඨානං ගතක්ඛණෙ සචෙ පස්සති දම්මි නො චෙ ගණ්හාමී'ති
පරිකප්පෙත්වා ගච්ඡන්තො අපස්සිතොපරිකප්පිතට්ඨානං අති
ක්කමෙය්‍ය පාරාජිකං, අයං ඔකාසපරිකප්පො නාම, ඉමිනාන
යෙන මෙභණ්ඩොකාස පරිකප්පා දට්ඨබ්බා.

**පටිච්ඡන්නාවහාරො**'ති, අඤ්ඤෙහි ඡඩ්ඩිතමුද්දිකාදිං දිස්වා
තෙහි අධුරනික්ඛෙපං භණ්ඩං ථෙය්‍යචිත්තෙන පංසුපණ්ණා
දීහි පටිච්ඡාදෙය්‍ය දුක්කටං, ඵන්දාපෙය්‍ය ථුල්ලච්චයං, ඨානාචා
වෙය්‍ය පාරාජිකං. පංසුකූලසඤ්ඤාය වා සකසඤ්ඤාය වා ඨානාචා
වෙය්‍ය අනාපත්ති භණ්ඩදෙය්‍යං පන හොති. අත්තනො ධුරනි
ක්ඛෙපං කත්වා ඡඩ්ඩිතභණ්ඩං ථෙය්‍යචිත්තෙන ගහිතෙ නත්ථි පා
රාජිකං, දුක්කටමෙව, භණ්ඩදෙය්‍යං පන හොති, සචෙ සාමිකා
ඤත්වා යාචෙය්‍යුං අදින්නෙ පාරාජිකං. තස්මා අත්තනො පයො
ගෙන ඡඩ්ඩිතබ්බත්තා. මුද්දිකාදිං ඡඩ්ඩෙත්වා පුනයාචෙත්වා
අපස්සිත්වා ධුරනික්ඛෙපං අකත්වා ගතා හොන්ති භික්ඛු ථෙය්‍යචි
ත්තෙන තස්මිං චෙවඨානෙ නිදහිතෙ උපරිභාගං අධොකත්වා
ඨානාචාවෙය්‍ය පාරාජිකං.

**කුසාවහාරො**'ති, කුසපණ්ණං ඨපෙත්වා චීවරභාජනක්ඛ
ණෙ අත්තනොබහුමග්ඝකොට්ඨාසම්පි පරිවත්තෙත්වා පරස්ස
පාරාජිකා කොට්ඨාසං ඡෙදෙත්වා ගහිතුම්පිච්ඡන්තො අත්ත
නො කොට්ඨාසෙ ඨපිතකුසං ගහෙත්වා පරස්ස කොට්ඨාසෙ
ඨපිතක්ඛණෙ නත්ථි පාරාජිකං. පරස්ස කොට්ඨාසෙ ඨපිතකු
සං ගහෙත්වා අත්තනො කොට්ඨාසෙ ඨපිතක්ඛණෙ හත්

තොමුත්ත මත්තෙයෙව පාරාජිකං. යෙව පඨමතරං පරස්ස කුසං ගණ්හාය්‍ය තාව රක්ඛති අත්තනො කොට්ඨාසෙ ඨපිතක්ඛණෙපි අත්තනො කොට්ඨාසතො කුසංගහිතක්ඛණෙපි රක්ඛති පරස්ස කොට්ඨාසෙ ඨපිතක්ඛණෙ ගය්හතො මුත්තමත්තෙයෙව පාරාජිකං. ඉදං ථෙය්‍යාවහාරපඤ්චකං නාම.

### පඤ්චවීසති අවහාරා නිට්ඨිතා.

සකසඤ්ඤාය ගහණෙ අනාපත්ති, විස්සාසගාහෙච තාවකාලිකං කත්වා ගහණෙච තිරච්ඡාන පෙතපිසාචාදීනං සන්තකං ගහණෙ ච පංසුකූලසඤ්ඤාය ගහණෙච උම්මත්තකාදි භාවෙන ගහණෙච අනාපත්ති. අඤ්ඤමනුස්සසන්තකභාවඤ්ච තං ජානනඤ්ච පාරාජිකප්පහොනකවත්ථුඤ්ච ථෙය්‍යචිත්තතා ච යථාවුත්තපඤ්චවීසති අවහාරෙසු අඤ්ඤතරෙන අවහරණං චා'ති ඉමානෙත්ථ පඤ්චඞ්ගානි.

### දුතිය පාරාජිකවිනිච්ඡයො නිට්ඨිතො.

---

යොපනභික්ඛු මනුස්සපාණං මාතුකුච්ඡියං පටි සන්ධිගහණ කාලතො පට්ඨාය තාපනමද්දන භෙසජ්ජදානාදිනා පයොගෙන මාරෙති තස්ස පාරාජිකං. පසූතකාලතො පට්ඨාය ''සාහත්ථිකො, නිස්සග්ගියො, ආණත්තිකො, ථාවරො, විජ්ජාමයො, ඉද්ධිමයො'ති, එතෙසු ඡසු පයොගෙසු එකෙන පයොගෙන මාරෙති පාරාජිකං. තත්ථකතමො සාහත්ථිකො? පයොගො කායෙන වා කායතො අමුඤ්චිත්වා කායපටිබද්ධෙන අසි ආදිනා වා පහරිත්වා මනුස්සපාණං ජීවිතාවොරොපෙති පාරාජිකං. කතමො නිස්සග්ගියො පයොගො? කායතො මුඤ්චිත්වා නිස්සට්ඨෙන සත්තිඋසුආදිනා ජීවිතාවොරොපෙති, පාරාජිකං. යං උද්දිස්ස පහරති තස්සෙව මරණෙන පාරාජිකං, අඤ්ඤස්ස මරණෙ නත්ථි පාරාජිකං. යොකොචිමරතූ'ති අනුද්දිස්ස පහරති තෙනෙවපහාරෙන යස්සකස්සචිමරණෙන පාරාජිකං, උභයත්ථාපි තස්මිං පහරිතක්ඛණෙ වා මරතු පච්ඡාවා තෙනෙවපහාරිතක්ඛණෙයෙව පාරාජිකං.—කතමො ආණත්තිකප්පයොගො?

වත්ථුකාලො ච දෙසො ච ආවුධං ඉරියාපථො
කරණස්සවිසෙසො'ති' ඡ ආණත්ති නියාමකා'ති.

තත්ථවත්ථූ'ති' පුග්ගලො අමුකං පුග්ගලං මාරෙහී'ති ආණත්තො සචෙ තමෙවමාරෙය්‍ය ආණාපකස්ස ආණත්තක්ඛණෙපාරාජිකං, මාරකස්ස මාරිතක්ඛණෙ පාරාජිකං. අථ අඤ්ඤං මාරෙය්‍ය ආණාපකො මුච්චති මාරකස්සෙව පාරාජිකං, මාරෙත්'ති'

ආණත්තෙන ආණාපකස්ස දුක්කටං ආණත්තස්ස පාරාජිකං. අත්තනො අඤ්ඤං මාරෙය්‍ය ආණාපකස්ස නත්ථි දුක්කටං ආණත්තස්සෙව පාරාජිකං.

**කාලො'ති** පුබ්බණ්හාදිකාලො, අජ්ජ පුබ්බණ්හෙ මාරෙහී'ති ආණත්තො තස්මිං චෙ පුබ්බණ්හෙ මාරෙය්‍ය උභින්නං පාරාජිකං, තෙන වුත්තකාලං අතික්කමිත්වා අඤ්ඤස්මිං කාලෙ මාරෙය්‍ය ආණාපකස්ස නත්ථි පාරාජිකං, දිවසමාසසංවච්ඡරෙසුපි එසෙව නයො.

**ඔකාසාදිසු විනිච්ඡයො ඉමිනා නයෙන ඤාතබ්බො.**

**තත්ථ කතමො ථාවරො**, අසංහාරිමෙන උපකරණෙන මාරණං, තං හි මාරෙතුකාමස්ස ඔපාතඛණනං විසයොජනං ඛග්ගාදිඋපනික්ඛිපනං රූපසද්දාදිඋපට්ඨපනමරණවණ්ණකථනං, මරණූපායදානාදිනි එවමාදි අනෙකප්පකාරං හොති. තත්ථ යො අසුකො නාම මරතූ'ති උද්දිස්ස ඔපාතං ඛණෙය්‍ය සබ්බඛණනප්පයොගෙ දුක්කටං, සො තස්මිං පතිත්වා දුක්ඛං ලභති ථුල්ලච්චයං, මාරෙය්‍ය පාරාජිකං. අඤ්ඤෙ මාරෙය්‍ය අනාපත්ති. යො කොචි එතස්මිං පතිත්වා මරතූ'ති අනුද්දිස්ස ඔපාතං ඛණෙය්‍ය අඤ්ඤතරො පතිත්වා මාරෙය්‍ය පාරාජිකං. යක්ඛපෙතපිසාචෙ උද්දිස්ස ඛණෙය්‍ය සබ්බඛණනප්පයොගෙ දුක්කටං, තෙ තස්මිං පතිත්වා දුක්ඛං ලභන්ති දුක්කටං, මාරෙය්‍යුං ථුල්ලච්චයං, තිරච්ඡානගතෙ උද්දිස්ස ඛණෙය්‍ය සබ්බඛණනප්පයොගෙ දුක්කටං තෙ තස්මිං පතිත්වා දුක්ඛං ලභන්ති දුක්කටං මාරෙය්‍යුං පාචිත්තියං, විසයොජනාදිසුපි විනිච්ඡයො ඔපාතඛණනෙ වුත්තනයෙනෙව වෙදිතබ්බො.

**කතමො විජ්ජාමයො**, මාරෙතුං මන්තං ජපනප්පයොගෙ දුක්කටං අඤ්ඤෙ දුක්ඛං ලභති ථුල්ලච්චයං මාරෙය්‍ය පාරාජිකං. **කතමො ඉද්ධිමයො**, ඉද්ධිපයොගො තස්මිං විපාකිද්ධි අඤ්ඤං මාරෙතුකාමෙන දාඨාකොටන මුඛොලොකනාදිප්පයොගෙ දුක්කටං දුක්ඛං ලභෙය්‍ය ථුල්ලච්චයං මාරෙය්‍ය පාරාජිකං.

**සාහත්ථිකාදිප්පයොග විනිච්ඡයො නිට්ඨිතො.**

අසඤ්චිච්ච මාරෙන්තස්ස අජානන්තස්ස අමරණාධිප්පායස්ස උම්මත්තකාදීනම්පි අනාපත්ති. මනුස්සපාණො මනුස්සපාණසඤ්ඤී වධකචිත්තං උපක්කමො තෙන මරණන්ති ඉමානි පඤ්ච මනුස්සවිග්ගහෙ අඞ්ගානි.

**තතියපාරාජිකවිනිච්ඡයො නිට්ඨිතො.**

---

අත්තනො සන්තානෙ අවිජ්ජමානං පඨමජ්ඣානං මම අත්ථී'ති වා සමාපජ්ජිම් වා සමාපජ්ජිං සමාපජ්ජිස්සාමී'ති වා අඤ්ඤස්සං මනුස්සසත්තානං විඤ්ඤුමානාදිප්පයොගෙන පරියාය මු

ඤ්ඤිත්වා උප්පුකං ආරොචෙති සම්පෙසිතං පුප්ඵලං ඤාපෙස්සාමී ‘ති’ යං උද්දිස්ස ආරොචිතෙ සො තංඛණඤ්ඤෙව ජානාති පාරාජිකං, නොචෙ ථුල්ලච්චයං චිරෙන වා ජානාති ථුල්ලච්චයං. අමනුස්සානං උප්පුකං ආරොචෙති උද්දිස්ස ආරොචිතෙ අමනුස්සො තං ඛණඤ්ඤෙව ජානාති ථුල්ලච්චයං, නොචෙජානාති චිරෙන වා ජානාති දුක්කටං දුතියජ්ඣානාදී ලොකියලොකුත්තරභූතා උත්තරිමනුස්සධම්මා ආරොචනෙ පි එසෙවනයො. පරියායෙන ආරොචනෙ තුම්හාකං සෙනාසනෙ වසනො භික්ඛු පඨමජ්ඣානං සමාපජ්ජතී’ති, ආදිනාවුත්තෙ සොපුඤ්ඤාලොතං ඛණෙයෙව ජානාති ථුල්ලච්චයං, නොචෙජානාති චිරෙන වා ජානාති දුක්කටං. අධිමානෙන ආරොචෙන්තස්ස අනුල්ලපනාධිප්පායස්ස උම්මත්තකාදීනඤ්ච අනාපත්ති.

**චතුත්ථපාරාජිකවිනිච්ඡයො නිට්ඨිතො.**

# සතරපාරාජිකා විනිශ්චය.

**භාවසන්නය.**

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

දෙවාතිදෙවවූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ විසින් සකලලොක සත්ත්වයාකෙරෙහි පතලාවූ මහාකරුණාවෙන් දෙසනාකරණලද ධම්මවිනයන් අතුරෙන් විනයධම්මය නමන්වහන්සේගේ අව්‍රසපුත්‍රවූ භික්ෂූන්ට පිළිපැදීම පිණිස දෙසනාකලසේක. එය ආපත්තිස් ස්කන්ධවසයෙන් සතක් වන්නාහ. ඔවුහු කවරහුදයත්? පාරාජිකාපත්තිස්කන්ධය, සංඝාදිසෙසාපත්තිස්කන්ධය, ථුල්ලච්චයාපත්තිස්කන්ධය, පාචිත්තියාපත්තිස්කන්ධය, පාටිදෙසනියාපත්තිස්කන්ධය, දුක්කටාපත්තිස්කන්ධය, දුබ්භාසිතාපත්තිස්කන්ධය, යනමේසතයි.

**මෙහිපාරාජිකා පත්තිස්කන්ධය යනුකවරේදයත්?**

මෛථුනපාරාජිකාවය, අදත්තාදාන පාරාජිකාවය, මනුෂ්‍යවිග්‍රහ පාරාජිකාවය, උත්තරිමිනිස්දහම් පාරාජිකාවය, යනමේ සතර පාරාජිකාපත්තිස්කන්ධයනම්වේ. මෙහි මෛථුන පාරාජිකාවනම් කවරේදයත්? උපසම්පන්න භික්ෂූන්ට අයිති සතරසංවරසීලයෙහි පිහිටා ඤත්තිචතුත්ථකම්මයෙන් උපසම්පදාවී උපසම්පදාව ඇතිව වසන යම්කිසි භික්ෂුවක්තෙම තමන්ගේ උපසම්පදාව අත් නොහැර එම උපසම්පදා සීලයපිටම සිටගෙණ නිස්මගින් යම්

මගක මෙවුල්දම් සෙවුනේවිනම් පාරාජිකාවේ, ඒ තිස්මාර්ගයෝ නම් කවරහුදයත්? මනුෂ්‍යස්ත්‍රිය අමනුෂ්‍යස්ත්‍රිය තිරිසන්ගතස්ත්‍රිය කියා ස්ත්‍රීහු තුන්දෙනෙක්ද එසේම මනුෂ්‍යඋභතොබ්‍යජනකයාය අමනුෂ්‍යඋභතොබ්‍යජනකයාය තිරිසන් උභතොබ්‍යඤ්ජනකයායයි උභතෝබ්‍යඤ්ජනකයො තුන්දෙනෙක්ද යනමොහු ස්ත්‍රීන්සදෙනෙක්වෙති, මොවුන් එකඑකාගේ මුඛමාර්ග මූත්‍රමාර්ග, වර්චස්මාර්ග වසයෙන් තුන්තුන් මාර්ගය බැගින් සදෙනාගේ මාර්ගයො දහඅටක්වෙත්, මනුෂ්‍යපිරිමියාය අමනුෂ්‍යපිරිමියාය තිරිසන්ගතපිරිමියායයි පුරුෂයො තුන්දෙනෙක්දවෙත් එසේම මනුෂ්‍යපණ්ඩකයාය අමනුෂ්‍යපණ්ඩකයාය තිරිසන්පණ්ඩකයායයි පණ්ඩකයෝ තුන්දෙනෙක්දවෙත් මොවුන් එකඑකාගේ මුඛමාර්ග වර්චස්මාර්ග වසයෙන් මාර්ගදෙකදෙකබැගින් සදෙනාගේ මාර්ගදොළසෙක්වෙත් මෙසේ මෙකී ස්ත්‍රීපුරුෂ දොලොස්දෙනාගේම තිස්මාර්ගයක්වන්නේය; මෙකී සියලු මාර්ගයෝම මෛථුන පාරාජිකාවට වස්තුවන්නාහුය, එකී මාර්ගයන්ගෙන් යම්මාර්ගයක ත්‍රණවස්ත්‍රපත්‍රාදියෙන් වසාහො නොවසාහෝ ප්‍රකෘතිවාතය නොවදිනා තෙත්වූ අවකාසයෙහි මෛථුන රාගචෙතනාව ඇතිව තලඇටයක්පමන සුදු තමන්ගේ උපක්‍රමයකින්හෝ අනුන්ගේ උපක්‍රමයකින්හෝ ලිග ප්‍රවේසනයකරණලද මහනතෙම ශිසකැපූ පුරුෂයාගේ ජීවිතය නැවත ප්‍රකෘතිවත්කිරිම නුපුළුවන්සේම ශාසනයෙන් චුතවන්නේය හෙවත් පාරාජිකාවන්නේය.

**මෛථුනපාරාජිකා විනිශ්චය නිමි.**

**අදත්තාදාන පාරාජිකාවනම්**—යම්කිසි උපසම්පන්න භික්ෂුවක් තෙම මිනිසත්බව ඇති යමෙක් සන්තකවූ සවිඤ්ඤාණකාවිඤ්ඤාණක කොසීමදෙයක්වත් මිනිසුන් වසන ගමකහෝ නොවසන ආරණ්‍යයකහෝ කොසීම ඉඩමක තිබුනත් අනුන්ගේය යන සඥාව ඇතිව සොරසිතින් විසිපස් අවහාරයන් අතුරෙන් යම්කිසි අවහාරයකින් ගණීද පාරාජිකාවන්නේය. එහි පස්විසි අවහාරයොනම් කවරේද? නානාභණ්ඩපඤ්චකය, ඒකභණ්ඩපඤ්චකය, සාහත්ථිකපඤ්චකය, පුබ්බපයොගපඤ්චකය, ථෙය්‍යාවහාරපඤ්චකය කියා, පසක් පසක් බැගින් පසක පහක්වෙත්. එහි "නානාභණ්ඩපඤ්චකය" සවිඤ්ඤාණකාවිඤ්ඤාණක වසයෙන්ද, ඒක භණ්ඩපඤ්චකය සවිඤ්ඤාණකවසයෙන්දවේ. එහි නානා භණ්ඩපඤ්චකය ආදියන හරණ අවහරණ ඉරියපථවිකොපන ඨානාචාවනයයි පස්ප්‍රකාරවේ. එහි ආදියන නම් හිමියන්විසින් කයින් වචනයෙන් නොදෙනලද ආරාම වතු කුඹුරු ආදියමක් වචාවෙන් ගැණීම පිණිස ලියුම් ලිවීම් නඩුකිම් ආදි

යම්කිසි උපාමාරුවක් යොදාඇති හිමියාගේ සන්තකයනැති කොටගැණීම ආදියනනම් අවහාරයයි කියනලද සටන්බැණ ගැණීම නම්වේ. **හරණනම්** අන්කෙනෙකුගේ බඩුවක්ගෙණ යමින් හිමියාට නොදී වචාවෙන් ගණිම්සි සොරසිත උපදවා අතෙහිහො කරෙහිහො තුබූ බඩුවක් තුබූතැනින් පහකොට අනිත්අතටහො කරටහො ගණීද බිමහො අන්කිසිතැනක හො තබාද ඒ හරණනම් අවහාරයයි කියනලද ගෙණයමින් සිටගැණීමනම්වේ. **අවහරණනම්** යමෙක් විසින් තමන්ලග ප්‍රවෙසමට හො අන්කිසිදෙයක්නියාහො භාරකොට තබනලද යමක් නැවත ඇති හිමියා ඉල්ලූවිට මමගත් බඩුවක් නැතකියාහො මම දන්නේනැත කියා හො ඇති හිමියාහට නෙලබෙන පරිද්දෙන් කියා කර අලය හැරවීම අවහරණනම්වූ අවහාරයයි කියනලද බොරුකියා ගැණීම නම්වේ. **ඉරියාපථවිකොපන** නම් බඩුසහිත මිනිහෙක් හො තිරිසනෙක් හො දූක බඩුසහිත වම මොහුගෙණ යම්සි වචා අදහස ඇතිව දෙපියවර හො සතරපියවර හො සිටියතැනින් මදක්වත් ඉවත්කර ගැණීම ඉරියව් පෙරලාගැණීමයයි කියනලද සොරකම නම්වේ. **ඨානාචාවනය** නම් ගොඩතිබෙන යම්බඩුවක් තුබූතැනින් සොරසිත උපදවා කෙසගක් පමණකුදු වෙන්කිරීම ස්ථානාචාවනයයි කියනලද තුබූ තැනින් පහකොට ගැණීමනම්වේ. මෙසේ අදත්තාදාන පාරාජිකාවට අයත් පස්විසි අවහාරයන් අතුරෙන් ''නානා භණ්ඩපඤ්චකයයි'' කියනලද පස්ආකාර අවහාරයන් කියා නිමවනලදී.

**එකභණ්ඩපඤ්චකය** නානා භණ්ඩපඤ්චකයෙහි දැක්වූ නියායෙන්ම ආදියන, හරණ, අවහරණ, ඉරියාපථවිකොපන, ඨානාචාවනය, යි පඤ්චප්‍රකාරවේ. එහි ආදියන නම් හිමියන් ඇති දාසයෙක් හො තිරිසනෙක් හො වචා ලියමන් ආදිය ලියාහො නඩුකියා හො ගැණීමයි. හරණනම් ඇති හිමියන්ට දෙන පිණ්ස ගෙණයමින්සිට ගැණීමයි. අවහරණනම් (ආරක්ෂාවට) ප්‍රවේසමට දිනිබූත්‍ණු දාසයෙක්හො තිරිසනෙක් හො අයිති ස්වාමියා නැවත ඉල්ලූකල දුන්නේ දන්නේ නැතැයි බොරුකියා ගැණීමයි. ඉරියාපථ විකොපනයනම් ඉරියව් පෙරලාගැණීමයි. ඨානාචාවනයනම් ඔවුන් සිටිතැනින් ඉවත්කොට ගැණීමයි. මෙසේ මෙ පඤ්චප්‍රකාරයෙන් සවිඤාණකදෙයක් ගැණීම එක භණ්ඩපඤ්චකය නම්වේ.

**සාහත්ථිකපඤ්චකය**, සාහත්ථිකය, ආනත්තිකය, නිස්සග්ගිකය, අත්‍ථසාධකය, ධුරනික්ෂෙපය, යි පඤ්චප්‍රකාරවේ. එහි සාහත්ථිකය නම් අනුන්ගේ බඩුවක් තමන්ගේම හස්තයෙන් ගැණීමය

**ආණත්තිකායනම්** අසවලාගේ අසවල්බඩුව ගණුවසිකියා ස්වාමියාගේ නොකැමැත්තෙන් ගැණීමට වෙනකෙනෙකුට නියමකාර ගැන්වීමයි. නිස්සග්ගිකායනම් රේන්ද නිරුව ගත්ණතැන්වල නියම මායිම්වල සිට පිටතට දැම්මද එසේම යමෙකුගේ බඩුවක් වචාවෙන් ගැණීම පිණිස ඈතටදමා නොපෙනෙන පරිද්දෙන් ගැණීමය. අභිසාධකායනම් අසවලාගේ බඩුව ගන්ණට යම්කලක හැකිවේද එවිට තෝ වචාවෙන් ගණුවසි කියා අනිකෙකුට නියමකෙරෙද එමනියමය ලත් තැනැත්තා කොයියම් කලක නමුත් නොඅනුමානව ගණිනම් එම නියමය කරණ ක්ෂණයේම අවහරණයවීමෙන් පාරාජිකා වන්නාවූ අභිසාධකා වහාරයනම්වේ. **ධුරනික්ෂෙපකනම්** ආරාම වතුපිටි කුඹුරු ආදියපිණිස ලිවූන් (හෙවත් ඔප්පු) ලියවාගැණීම් බොරු සාක්ෂි කියවාගැණීම් එසේම තමන් බොරුසාක්ෂිකීම් වසයෙන් යම්කිසි වචාක්‍රියාවක් කලවිට ඈනිගිම්යාට ඉනින් නැතැයි සිතා අලය හැරීමෙන් සහ තාවකාලිකව හෙවත් දෙනතුරු ගත් යම්කිසි දෙයක් නැවත ඉල්ලූ විට නොදී මෙන් නැවත නොදෙමියි යන සිතින් සිටිනවිට ඈනිගිමියාද ඉනින්මට නොලැබේය යනසිතින් අලයහැරීමෙන් වන්නාවූ ධුරනික්ෂෙපප නම් අවහාරයද යනමේ පස සාහත්ථිකා පඤ්චකය නම්වේ. **පූර්වප්‍රයොගපඤ්චකය**, පූර්ව ප්‍රයොගය, සහප්‍රයොගය, සංවිදාවහාරය, සංකෙතකම්මය, නිමිත්තකම්මයයි පඤ්චප්‍රකාරවේ. එහි පූර්වප්‍රයොගයනම්, අනුන්ට යම් අලාභයක් වෙණ පිණිස (නොහොත් කරණ පිණිස) ප්‍රථමයෙන් උපාමාරු යොදාතිබීමය, එයින් යමෙක් සන්තකව තිබී යනදෙයකට අලාභ වීමද අනුන්ට නියමකිරීමද පූර්වප්‍රයොගය නාම්වේ. සහප්‍රයොගය නම් තිබුනුතැනින් ඉවතකිරීමය, එනම්—යමෙකුගේ වතු කුඹුරු ආදියට ලකුණුපිණිස සිටුවාතිබෙන උල්කණුආදී යමක් උගුලා අබැටක් පමණවත් එහාමෙහාවීම් වසයෙන් සිටවීම සිටුවවීම යනාදිය කරණාවා හා සමගම පෙරපසු නොව අවහරණය වීම සහ ප්‍රයොගයනම්වේ. සංවිදාව හාරයනම් අසවලාගේ අසවල්බඩුව ගණිමුවකියා නියම කරගෙණ එක්කෙනෙක් ගත්තත් නියමකරගත් සියළුදෙනම එකතුව ගත්තත් සම්මතකරගත් සැමදෙනාටම අදත්තාදාන පාරාජිකාව සිද්ධවෙන්නාවූ අවහාරය “සංවි:වහාරය නාම්වේ. සංකෙතකම්මයනම්, පූර්වාණ්හාදිවසයෙන් කාලය හෙවත් වේලාවක් නියමකොට අසවල් වේලාවට මෙනම් බඩුව ගණුවසිකියා නියමකර කීමය, එසේ නියමකල වේලාවටම අනාතාරාවක් නැතිව එකාන්තයෙන්ම නියමය ලැබූතැනැත්තා හො ඔහුගේ වෙනුවෙන් පත්කර වෙන යමෙක් ලවාහෝ නියමකල වේලාවට

පෙර පසු නොව ගැණීම සංකෙත කම්මයෙන් වන අවහාරය නම්වේ. නිමිත්ත කම්මයනම් සෑළපදවා ඇමපිණිස ඇහැකෑනීම් හිස වැනීම් ආදී නිමිත්තක් පෙන්නා ඒ අනුසාරයෙන් ගැණීමය, ඉදින් වනාහි ඒ කරණලද නිමිති සඤ්ඤාවෙන් පෙර පසු නොව ඒ අනුසාරයෙන් අනුන්ගේ බඩුවක් ගණීද, එ නිමිති කම්මයෙන් වන්නාවූ අවහාරයනම්වේ. මේ දැක්වූවාවූ පූර්වප්‍රයොග පඤ්චකය වසතුව ගණ්ණට ප්‍රථමයෙන් ගැණීමපිණිස යොදවනලද උපාමාරුය—ඒ උපාමාරු කරණකොටගෙණ නියමයෙන්ම(හෙවත් එකාන්තයෙන්ම)ගණීනම් බඩුගන්නට ප්‍රථමයෙන් නියමකල ශික්ෂුව පාරාජිකාවන්නාවූ නියමයලත් අයත් ශික්ෂූනුම නම් ඒ ශික්ෂූනු බඩු තිබූතැනින් කෙසගක්පමණ කුඩු වෙත්කොට ගැණීම හා සමගම පාරාජිකා වන්නාවූ කාරණා පස නිසා පූර්ව ප්‍රයොග පඤ්චකය නම් වන්නේය.

**පඤ්චාවහාර පඤ්චකය.** ථෙය්‍යාවහාරය, පසය්හාවහාරය, පරිච්ඡන්නාවහාරය කුසාවහාරයයි පඤ්චප්‍රකාරවේ. එහි ථෙය්‍යාවහාරය නම් ගෙවල් බිඳීම් සෑරීම් වසයෙන් නොපෙනීමෙන් හෝ වංචාකොට හිරීමෙන් හෝ වංචාකොට මැනීමෙන් හෝ රන් රිදී මැණික් නොවන දෙය රන් රිදී මැණික් ආදියක් මෙන් හො වංචාකොට ගැණීමනම්වේ.

**පසය්හාවහාරයනම්** යමෙක් වනාහි ගම් පැහැර ගණ්ණාවූන් සෙයින් බලාත්කාරයෙන් හෝ රාජ බැලයන් සෙයින් තමන්ට ලැබිනිබෙන අයවලට වැඩියෙන් හෝ ගණීද මෙසෙ ගණ්ණහුගේ ගැණීම පසය්හාවහාරයයි කියනලද බලාත් කාරයෙන් ගැණීමනම්වේ. පරිකප්පාවහාරයනම් බඩුවසයෙන්ද අවකාසවසයෙන්ද දෙයාකාරවේ. එහි බඩුවසයෙන් කල්පනාකොට ගැණීමනම් සළුවලින් ප්‍රයොජන කැමැත්තෙක් තෙම ගෙයක් තුලට ප්‍රවිෂ්ටව ඉදින් සළුනම් ගණ්ණෙමි නූල්නම් නොගණ්ණෙමි කල්පනාකොට නොපෙනෙන්නාවූ අනධකාරයෙහිදී යම්කිසි පොදියක් ගණීද, ඉදින් ඒ පොදියේ තිබී ගියෙ සළු හෙවත් වස්ත්‍රනම් තිබුනුතැනින් ඔසවා ගන්ණවා හා සමගම පාරාජිකාවේ. ඉදින් යම් තැනකට ගෙණනොස් පොදිය මූදාබලා නූල් බව දැනගෙණ නැවත තිබූනු තැනම ගෙණවුත් තබානම් පාරාජිකා නොවේ—නූල්බව දැනගණ යමක් ලද්දේද ඒ දෙය ගණ්මිසිතා බිමතිබී ඔසවාගණීද, අනෙ තිබී බිමතබයිද කරේ හිසෙ තබාගණනම් පියවර ඔසවා තබසිද එකෙණෙහිම පාරාජිකාවේ—මෙසේම ගණ්ණාවූ බඩුව නියමතරගෙණ ගැණීමෙහිදී සියළුම බඩුවලටම වන්නාවූ මේ අවහාරය "භණ්ඩපරිකප්පාවහාරය" නම්වේ. අවකාශ වසයෙන් කල්පණාකර ගැණීම නම්, අනුන්ගේ පිරිවෙන් විහා

රාදියට ගියාවූ යමෙක් ඇලය කටපූතු බඩුවක් දැක ගබඩා වාරය
ඉදිරිය ප්‍රාසාදයෙන්යට දොර කොටු ප්‍රාකාර වෘක්‍ෂමූලාදී වස
යෙන් ස්ථානයක් නියමකරගෙණ ඉඳින් මේ අතරෙහිදී මේ බ
ඩුව යමෙක් දිටුයේවීනම් නිකමට අරන් බැලීම්ආදිය පිණිස හැ
සිරෙන ආකාර දක්වා තබමි, ඉඳින් මෙ අතරෙහි යමෙක් නුදු
ටුයෙවීනම් ගෙණයම්යි සිතාගත්තේද, නියමකරගත් නො
හොත් කල්පනාකරගත් අවකාසයෙන් ඉවත්කරණවාහා සම
ගම පාරාජිකාවන්නේ "ඔකාශපරිකප්පාවහාරයනම්වේ—මෙ
සේ බඩුව සහ ඉඩමත් කල්පනාකර ගණ්ණාවූ අවහාරය පරි
කල්පනාවහාරය නම්වේ. පටිච්ඡන්නාවහාරයනම් යම් භික්‍ෂු
වක්තෙම උද්‍යානාදියට පැමිණිව්වක හෝ මාර්ගාදියෙහි ය
නවිටක හෝ යමෙක් මුදු, තබනලද හෝ සිහිමුලාව වැටිනිබු
නාවූ හෝ බඩුවක් දැක වචා අදහසින් පස්වලින් හෝ තෘන
පත්‍රාදියකින් හෝ වසාතබයිද, හිමියන් විසින් සොයාබලා
නොදැක නැවත සොයම්සිසිතා ඇලය ඇතුව යයිද, එවිට ගැ
ණීම හො මඩාදියක ගල්වාතබයි හෝ ජලයක ගල්වාතබයි
හෝ මෙසේ යමකින් වසා නොහොත් යමකින් යටකර තබා
ගැණීම "පටිච්ඡන්නාවහාරය"නම් වන්නේය.

**කූසාවහාරය නම්** යම් භික්‍ෂුවක්තෙම උන බටාදි පතුරක
හෝ තල්පත් ආදියක හෝ සහිඥවපිණ්ස සලකුණුකරණ
ලද යම්කිසි කුසයක් සිව්රුආදිය බෙදනුලබනකල්හි තමාගේ
ලකුණට නියමවූ කොටස ලගනිබුනාවූ අඩුවූහෝ වැඩිවූ හෝ
තමන්ගේ කොටසට සමානවූ හෝ පාදයක් හෙවත් කහවනු
වකින් සතරෙන් කොටසක් වටින්නාවූ අන්කොටසකට වැටු
නු කුසය තමන්ගේ කොටසෙහි දමා තමන්ගේ කොටසෙහි
වැටුනු කුසය අනුන්ගේ කොටසෙහි දමාද ඒ දැමූ ක්‍ෂණයෙ
හිම පාරාජිකා වන්නාවූ අවහාරයකූසාවහාරය නම්වේ.

**පස්විසි අවහාරය නිමි.**

මෙසේ දැක්වූ පස්වසි ආකාරයෙන් යම්කිසි හැටියකින් අන්
හිනිපැවිදි කොයිම කෙනෙක් සන්තක කොයිම දෙයක්වත්
කයින් වචනින් නුදුන්දෙයක් වචාවෙන් හෝ බොරුකියා
හෝ බලාත්කාරයෙන් හෝ ගණීද, එබදු මහණතෙම කරටි
යකාඩනලද තල් පොල් කිතුල් ආදී වෘක්‍ෂයන් නැවත සැදීමට
නොයන්නාසේ සර්වඥශාසනයෙහි භික්‍ෂුභාවයට නැවත පැමි
ණෙන්නට බැරිව් අභව්‍ය පුද්ගලයෙක්ම වන්නේය.

දෙවෙනි **අදත්තාදානපාරාජිකා විනිශ්චය නිමි.**

---

යම්කිසි භික්‍ෂුවක් තෙම වධක චෙතනාව හෙවත් මරම් යන
සිත ඇතිව මව්කුස පිළිසිදගත්තැන්පටන් හෙවත් කලල අ

වසථාවේපටන් දූනදූන උංගෙණින් තැවීම් අත්පාවලින් මැඩීම් බෙහෙත්දීම් ආදී යම්කිසි ආකාරයකින්මරාද නොහොත් මරවා ද පාරාජිකාවේ. මව්කුසින් බිහිඋනු තැන්පටන් **ප්‍රයොග සයක්** මනුෂ්‍ය විග්‍රහ පරාජිකාව පිණිස වන්නේය, මේ මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවගේ විස්තාරාවබොධය පිණිස ප්‍රාණිය දතයුතුය ප්‍රාණඝාතය දතයුතුය ප්‍රාණඝාතයාගේ ප්‍රයොග දතයුතුය. එහි ප්‍රාණිය යනු ව්‍යවාහාරවසයෙන් සත්වයාය, පරමාර්ථවසයෙන් ජීවිතෙන්ද්‍රියය, ප්‍රාණඝාතය යනු මරම් යනසිත උපදවා ජීවිතෙන්ද්‍රිය හෙවත් ප්‍රාණිය සිදීමය, ප්‍රාණඝාතයාගේ ප්‍රයොගය නම් ජීවිතය සිදීම යන සිතමූල්ව ප්‍රාණිය නැසීමට කාරණ උපායවේ, ඒ ප්‍රයොගයතෙම ''සාහත්ථිකය නිස්සග්ගිකය ආනත්තිකය ථාවරය විජ්ජාමය ඉද්ධිමය''කියා සයාකාරයක්වේ. එහි සාහත්ථික ප්‍රයොගයනම්? ප්‍රාණිය නසන්නාවූ තමන්ගේම කයින් හෝ කයපිළිබඳ දඬුමුගුරු අවිආවුධාදියකින් හෝ ඇන කොටා මැරීමවේ. **නිස්සග්ගික ප්‍රයොගයනම්** තමන්ට ඈත්ව දුරස්ථියෙන් මරණු කැමැත්තෙන් කයින් හෝ කයපිළිබඳ දෙයකින් හෝ ඊ අඩසරි යනු ගල් මුල් ආදිය ගසා මැරීමනම්වේ. මෙහි යම් ප්‍රාණියක් නියමකරගෙණද නියමකර නොගෙණ දූයි කියා දෙයාකාරවෙත්. එහි යමෙක් නියමකරගෙණ යම් කිසිවක් දමාගැසූකල නියමකරගත් ප්‍රාණියම නැසූනේවීනම් ප්‍රාණඝාතමය පාපය සිඩවේ අනියම් ප්‍රාණියක් නැසූකල සිඩ නොවේ. කොයිමකෙනෙක් නුමුත් නැසේවා සිතාගෙණ ගැසූ කැටකැබිලිති දඬුමුගුරු අවිආවුධවලින් කොයිම ප්‍රාණියක්වත් නැසීමෙන් ප්‍රාණඝාත පාපය සිඩවේ. එසේම මරණසිතින් ද මාගසකලද ගල්මුල් කැටකැබිලිති දඬුමුගුරු අවිආවුධාදී යම් කසප්‍රීයාගේ වේදනාවම කාරණකොටගෙණ එංලෙම හෝ වම්හාණනකට පසුවහෝ මැරේද ප්‍රාණඝාතමය පාපය ඒ ක්ෂණ ගැහිම සිදුවේ. මෙසේ නිස්සග්ගිකප්‍රයොගය උද්දිස්ස නොද්දිස්සවශයෙන් දෙවැදූරුම්වේ. ආනත්තික ප්‍රයොගයනම්-අසවලා මරවයිකියා අන්කිසිවෙක්හට අනාඥකොට මැරවීමය;එසේ අනාඥකොට මැරවීම, පුද්ගලයාද කාලයද අවකාශස්ථානයද මරණ ආවුධාදියද ඉරියව්වද ක්‍රියාවිශෙෂද කියා සයාකාරයක් වේ, ඒ සයාකාරයන් අතුරෙන් යමක් නියමයට වෙනස්ව කලේවීනම් නියමය ලත්තැනැත්තාට ප්‍රාණඝාතමය පාපය සිදුවේ නියමකල තැනැත්තාහට නොවන්නේය; එනම් යමෙක් හට අසවලා මරවයි කියා නියමකරයිද ඒ නියමය ලැබූ තැනැත්තේ නියමකල පරිද්දෙන්ම මරයිද. එසේම උදය වරුවෙහි හෝ සවස් වරුවෙහි හෝ රාත්‍රියෙහි හෝ යම්කිසි වේලාවක් මරණ්ණට නියම කරයිද ඒ නියම... ... වේලාවට මර

සීද ග්‍රහයක්නුලදී හෝ දෙරම්දුල් ආදී යම්තැනක් හෝ මැරීම ට නියමකරයිද, ඒ ස්ථානයෙහිදම මරයිද අසවල් ආයුධයෙන් මරව අසවල් ඊරියව්වෙහිදී මරව අසවල් ක්‍රියාවකොට මරවයි නියමකරයිද ඒ නියමයවූ පරිද්දෙන්ම මරයිද අනාඥ කල තැනැත්තේද අනාඥව ලන්නැනැත්තේද දෙදෙනම ප්‍රාණඝාතමය පාපයටබැදෙ, නියමයවරදවා නොහොත් ඉක්මවා ප්‍රාණඝාතය කලෙව්නම් අනාඥවකල තැනැත්තා ප්‍රාණඝාතයෙන් මිදී අනාඥවලන්අයම ප්‍රාණඝාත පාපයට බැදේ. ථාවර ප්‍රයොගයනම් පුද්ගලයෙක් මරණු කැමතිව ආවාටසාරා යමක් හෙලා කැක්මක් හෝ වියයෙදිමාදී යමක්හෝ මරණපිණිස යොද, තබා එයින් සිදුවෙන මරණයෙන් ථාවර ප්‍රයොගනම් ප්‍රාණඝාතමය පාපය සිදුවේ, මෙහෙද පලමුකී පරිද්දෙන්ම උද්දිසා නොද්දිසාවසයෙන් දෙවදෑරුම්වේ. විද්‍යාමය ප්‍රයොගයනම්—යන්ත්‍රමන්ත්‍ර ඇස්බැඳුම් ආදී යම්කිසි විද්‍යාවක්කොට මැරීමය. **ඍද්ධිමය ප්‍රයොගය නම්**—පෙරකරණලද කුසලකම්මාදියක් හෙතුකොටගෙණ මහත් අනුහස් ඇත්තෙක්ව සිටගණ භායගත්වා තරවවූකොට ලැයතම්පාකිරීම් ආදියෙන් මැරීමය. මෙසේ මෙ දැක්වූ සයාකාර ප්‍රයොගයන් අතුරෙන් යම් කිසි ප්‍රයොගයකින් හෝ, තොපිද නි විදිනදුක ඉතාදරුණුය මෙයාකාර සිලවන්තයෙක්ව ගුණවන්තයෙක්ව සිට මියයාමෙන් දෙව්ලොව මිනිස්ලොව ඉපිද මේ මේ සම්පත් අනුභව කිරීමෙන් සැපලැබෙනවාය කියා මරණයට කැමැත්ත උපදවාදීමෙන් ඒ වණ්ණනාවපිටම හෝ යමෙක් තමන්ගේ උපක්‍රමයකින් හෝ මියයනු කැමතිව ආහාරඅනුභව නොකොට ඉඳිමෙන් හෝ නාසාවාතය වලක්වාගැණීමාදී යම්කිසි හැටියකින් ප්‍රාණය නාසාගත්තේවීනම්, මරණයෙහි ගුණ වණ්ණනාකල භික්ෂුව පාරාජිකාවටම පැමිනෙන්නේය, මෙසේ යම්කිසි මනුෂ්‍යඝාතමය ඇත්තෙක් මව්කුස පිලිසිඳගත්තැන්පටන් මනුෂ්‍ය ඇසට නොපෙනෙන කලලාවස්ථාවේසිට මව්කුසින් ඉපිද අවුඇතිතෙක් හෝ වාසයකොට කම්මයවූ නියාවෙන් වන්නාවූ කාලමරණයද උපච්ඡේදකාදි කම්මයකින්වන අකාලමරණයද යන උභයාකාරයෙන් තෙමේම මියයාම නොවී යම් භික්ෂුවකගේ වචනාදී උපායකින් මරණය සිදුවූයේවීනම් ඒ භික්ෂුවද පැසීමෙන් ඉදී කසාවන් පෑයට ගොස් නටුවෙන් ගිලිහී වැටුනු පත්‍රයක් නැවත නීලවණ්ණයට කිසිකලකවත් නොයන්නාසේම භික්ෂුභාවයෙන් චුතව නැවත උපසම්පද, ගුණයකා ඒ ආත්මයෙහිදීම කිසිපරිද්දකින් පිහිටවන්නට නුදුළුවන් අභව්‍යයෙක්ව පාරාජිකාවට යන්නේය.

**තුන්වෙනි මනුෂ්‍යවිග්‍රහ පාරාජිකා විනිශ්චයනිටි.**

යම්කිසි උපසම්පන්න භික්ෂුවක් තෙම තමන්කෙරෙහි නැත්තාවූ ධ්‍යානාදි උත්තරි මනුෂ්‍ය ධම්මය අත්මිනිසත් බව ඇත්තාවූ කියනලද වචනයෙහි සවනා අර්ථය තේරුම් යන්නාවූ ස්ත්‍රී පුරුෂ ගෘහස්ථ ප්‍රව්‍රජිත කොයියම් කෙනෙක් හා සමග තුමුත් ධ්‍යානප්‍රමොක්ෂාදි යමක් හෝ ප්‍රථම ධ්‍යානාදි එක එක ගුණයක් හෝ දෑලොස්රියනකින් තුදුරුව සිට වචා අදහසින් කියාදේද, එ කියාදුන් ක්ෂණයෙන්ම ඇසූතැනැත්තේ ඒ සැබෑවට පිළිගණ්ද ඒ ක්ෂනයෙහිම පාරාජිකා වන්නේය, යාම් රිම් ආදි ඊර්‍යාපථයකින් හෝ වෙනයම් කාය උපක්‍රමයකින් හෝ තමන් ධ්‍යානසමාපත්තියට සම්වැදුනු කෙනෙක් සමවදින කෙනෙක් සමවදින්නාවූ කෙනෙක් බව හැඟියන්නාවූ පරිද්දකින් කායින් හෝ කායපිළිබද දෙයකින් හෝ අඟවාදේද, එ අඟවන අදහස නොවරදවාම අත්මිනිසත් බව ඇත්කෙනෙක් තෙරුමට ගණ්ද, එක්ෂණයෙහිම පාරාජිකාවන්නේය, එසේ අඟවාදුන් ක්ෂණයෙන් පසු යටත්පිරිසයින් සිලසුඩිය ඇතුව විවේකස්ථානයකහිද භාවනාවකයෙදී වසනකල සමාධියෙන් ධූත් ආලොක මාත්‍රයක්වූ නැතුව ප්‍රකාශකෙලෙව්නම් නැවත ගෘහස්ථවීමෙන් පිරිසිදුවක් ලබනවා මිස දෙබෑවීගිය ගලක් නැවත පෑස්සීමෙන් සන්ධිබවට නොයන්නාසේම භික්ෂුභාවයෙන් ඒ ආත්මයෙහිම පිරිසිදුවක් කිසිපරිද්දකින් ඒ පුද්ගලයාහට නොලැබීමෙන් තෙලෂයන්ගෙන් පැරදී අභව්‍යාවීමට යන්නේය.

සතරවෙනි උත්තරි මනුෂ්‍ය ධම්මපාරජිකා විනිශ්චය නිමි.

**සතරපාරාජිකා විනිශ්චය නිමි-**

---

**හෙ ර ණ සි කා.**

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**හෙරණහට** දසසිල් දසසික දසපරිජ් දසනාසනා දසදඬුවම්වත්. හෙරණහට දසසිල්නම් කවරහයත්, පණීවධයෙන් දුරුවීම, අයිනාදනින්දුරුවීම, අබ්‍රම්සරින් දුරුවීම, මුසවායෙන්දුරුවීම, රහමෙරින් දුරුවීම, විකල්බොජුනෙන් දුරුවීම, නටනු ගනු වයනු විසුලුදස්නෙන් දුරුවීම, මල්ගඳවිලවුන් ඇ ඳැරීමෙන් දුරුවීම, උසසුන් මහඅස්නෙන් දුරුවීම, රන්රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුවීම, යනමෙ හෙරණහට දසසිල්නම්වේ. හෙරණහට දසසික නම් කවරහයත්, මේ දසසිල්ම හික්මිය යුතු බැවින් දසසිකනම්වේ.

හෙරණහට **දසපරිජිනම්** කවරහයත්, දෑන දෑන සතක්හු දිවි ගැලවූවපරිජිවේ, දෑන දෑන දනා අයත් දෑහු වැලයකුදු සොරසිතින්ගත පරිජිවේ, දෑන දෑන තිරිසන්ගිය මාගමකහාද මෙවුන් දම් සෙවිය පරිජ්වේ, දෑන දෑන සිනාමුසුබසිනුදු මුසවා කිව පරිජි

වේ, දූන දූන පිනිබිදක්සාද රාටිකක් පූව පරිජිවේ, බුදුරුවන්ගි අපූණුකිව පරිජවේ, දමුරුවන්ගි අපූණුකිව පරිජිවේ, සඟුරුවන් ගි අපූණුකිව පරිජවේ, පුවතක් මෙහෙණිකහාද මෙවුම්දම්සෙ විය පරිජිවේ, අනියත මිසදිටුගත පරිජිවේ, යනමේ හෙරණ හට් දසපරිජනම් වේ.

හෙරණහට **දසනාසනා නම්** කවරහයත් මේ දසපරිජිම දස නාසනානම්වේ. මෙහි පසෙක් ලිඟනාසනාය පසෙක් සබ්බ නාසනායි, පස්ලිඟනාසනානම් කවරහයත්, දූන දූන සතක්හු දිවිගැලවූව, දූන දූන, දනා අයත්දැහු වැලයකුදු සොරසිතින් ගත, දූනදූන නිරිසන්ගිය මාගමක හාද මෙවුම්දම් සෙවිය, දූන දූන සිනාමුසු බසිතුදු මුසවා කිව, දූනදූන පිනිබිදක්සාද රාතික ක්පූව, මේ පස්ලිඟනාසනානම්වේ. පස්සබ්බ නාසනානම් කව රහයත්, බුදුරුවන්ගි අපූණුකිව, දමුරුවන්ගි අපූනුක්ව, සඟුරුව න්හි අපූනුකිව, පුවතක් මෙහෙණිකහාද මෙවුන්දම්සෙවිය, අ නියත මිසදිටු ගත යන මේ පස්සබ්බනාසනානම්වේ. හෙරණ හට දසදඬුවම්වත් නම් කවරහයත්? විකල්බොජුන, නටණු ග ණු වයණු විසුළුදස්න, මල්ගඳවිලවුන් ඇදූරීම, උසස්හුත් මහඅස් නෙහි හිඳිම, රන්රිදී මසු කහවනු පිළිගැන්ම, පැවිද්දන්ලබන ලාභයෙන් පිරිහෙලීම, පැවිද්දන්ට උපද්‍රව සඳහා පියොකිරිම, පැවිද්දන්ලගිනා අවසින් නෙරණට පියෝකිරීම, පැවිද්දන්ට ආකොසා පරිකොසා බිණීම, පැවිද්දන් පැවීද්දන් කෙරෙහි බිද විම යන මේ හෙරණහට දසදඬුවම්වත්නම්වේ. මෙහි පසෙක් වැලි දඬු වම්වති, පසෙක් සඟරම්න් නෙරණවති, වැලිදඬුවම් වත් පසනම් කවරහය ත්? විකල්බොජුන නටනු ගනු වයනු වි සුළුදස්න මල්ගඳ විලවුන් ඇදූරිම, උසස්හුන් මහඅස්නෙහි හිඳි ම, රන් රිදී මසු කහවණු පිළිගැන්ම, යන මේ පස වැලි දඬුවම් වත් නම්වේ සඟරම්න් නෙරණවත් පසනම් කවරහයත්? “භි ක්ඛූනං අලාභාය පරිසක්කති ක්ඛූභිනං අනත්ථාය පරිසක්කති භික්ඛූනං අවාසාය පරිසක්කති භික්ඛූනං අක්කොසති පරිභා සති භික්ඛූ භික්ඛූහි භෙදෙති”යන මේ පස සඟරම්න් නෙරණ වත් නම් වේ.

**හෙ ර ණ සි ක නි මි.**

**දිනචරියාව**—සැදෑහැයෙන් සසුන්වත් කුලදරුවන් විසින් අරුණට පලමුව දූ හැවිවළඳ මළපෙත්මත් හැමදනිමවා පැන් පෙරහාතබා විවෙක වත්සැපසීමෙන් නුන්පැයක්යවා ගෙබිය ගැහූකල

“සතංහත්ථිසතංඅස්සා සතංඅස්සතරීයථා
සතංකඤ්ඤා සහස්සානි ආමුත්තමනිකුණ්ඩලා
ඒකස්සපදවීතිහාරස්ස කලංනාග්ඝන්තිසොළසිං.

යනාදීන් සිහිකෙරෙමින් දාගැප් මහබෝයට එළඹ වත් සපයා පිදියහැක්වතක් ඇතපුද "ඉතිපි සොභගවා" යනාදීන් නවඅරහාදි බුදුගුණ සිහිකොට අනන්‍යවිහිතනොව වැඳ එක විටම ආපූචජාකොට ගෙණ නැගීසිට පිළිවෙලින් පත්කඩත බා වැඳගෙණ ලිතබලා අවවජා පොහොකළ දවස බුඩ වළිය කියා එකල

"තසසපාසාදිකංහොති පතනචීවරධාරණං
පබබජජා සළලාතසසයසස සීලං සුනිමමලං"

යනාදීන්සිහිකොට පාසිව්රු දරව කමටහණ්ගෙණ ගමටවද නාකලඅවායඝ උපාධ්‍යායන්ට නුදුරුව නොලංව ගොස් සිව්රුව ලදනාතැන හැමැද පාත්‍රයමුදාදිලා කැටුව ගමටවැද සත්පුරුෂ යන් ඇත් අස් රථ පාබලසෙනග නොයෙක් දික් නොබලා සෙඛියාකීසෙසින් සිගාගෙණ කැවිවනික්ම පාත්‍රයහා සඟලසිව් ර දෙයතින් අල්වා කමටහන් මෙනෙහිකරණුවන් විසින් වෙහෙරට අවුත් සිව්රුවසපිස තබා ගිදිනා හසුන් පණවා පත්ස ලා පාදොවා පැන්බලා දාහැර්දබු එලවාදී තමාගේ පාත්‍රයේ පරි යාපන්නවුන්ට දන්දිලා කිසිවක් උන් නොගතහොත් බත්සර එවක් දන්දීලා ඇසෙනයේ පස්විකාගෙණ සෙඛියා ක්සෙසින් අහරකිස නිමවා පිළිවෙළින් වැඩිමහළුතැන්ගේ පාත්‍රාසෝද, වත් සපයා බොජුන් හල හැමද ගුරුන්ටවත් දක්වා ඉක්බිති ගුරුන්ගා බුදුන්වැදගෙණ විවෙකසථානයෙක්හිඳ අතීත පස් විකුම් පස්විකාගෙණ සිල්බලා මෙත්කොට ගෙණ පැයක් විත රකින් අඩගසාඑකල, පොතකියා පතලියා අසනපිරිවහනදෙ යවන පොත්කොටලා විදශීනාධුරයෙහි යෙදෙන්නාවුන් වි සින් වෙනවෙනම හිඳ තමහට නියතපෙළවනපොත් දිලාඅසා ගණ වේලා ඇතහොත් වනපොත්කොටලා රැවෙන්ට පැයක දී ගෙමළු හැමන්දසූත්‍ර. වත් පැම්නියන් විසින් ගිනිඑලවා පහන් පූද, බණසලසා ආරාධනාකොට පයට පැන් එලවා පිළිවෙළින් හිඳ බණඅසා පිරිත්බැණ ගෙණ ගුරුන්ටවත් දක්වා වැඳ විචාළ මනා සැක ඇත විචාරාගෙණ පුහුණුකරණුවන් ඇත පිරිවහා සෙඛියා චතුපාරිසුඩිසීලයපිරිවහාගෙණ තමන් සැතපෙනගෙ යි වැඩිමහල්ලන් ඇත පයවත්සපයා වැඳ අවකාශගෙණ තමා සැතපෙන අස්නෙහි හිඳ පස්විකාගෙණ සතර කමටහන් මෙ නෙහිකොට අළුයම නැගී සිටිම් යන සිත්ඇතිව නිද්‍රොපගතව අළුයම නැගීසිට පස්විකාගෙණ සතරකමටහන් මෙනෙහි කොට රතනසූත්‍රයෙන් පිරිත්බැණගෙණ මෙත්කොට අරු ණට පළමුව වත් සැපසීමෙන් පළමුක්සෙසින්ම කරණුවන් විසින් දෙවේලෙහිම මෙත්පිරිත් සංවේගවසතු අට අසුභ මරණානුසමෘති සිහිකොට කරණුවන් විසින් එක්වම් දසඩ ම්මසූත්‍රය මෙනෙහි කිරීමෙන් ජනාදීන් අපායෙහි හැසිරසිවු

වාක්මෙන් නොකොට ඔවුනොවුන්ගේ දුටුවරද කීමෙන් මෙතනාවච්කම්මීය පූර. “යොපන භික්ඛු ධම්මානුධම්මපටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී සොතථාගතං සක්කරොති ගරුකරොතිමානෙති පූජෙති පරමාය පූජාය පටිපත්ති පූජාය යි” වදාළ අවවාදසිතතබා බුදුන් මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදනුවන් විසින් මෙකිදිනචරියාව කොලේ ඇද්දූසි විචාල කල උන් විසින් මුවෙන් නොබිනිමෙන් හා උවමනා කිසි කටයුත්තකට කාරණා කියාලීමෙන් පමාවැරැද්දකට වැලිලා සක්ගෙණහැර මළුවෙගිලා එක්වන් දිනචරියාව පසස්නාන් විසින් සබ්‍රම්සරුන්ගේ සිව්රුගෙත්තම්ක්‍රිම් පාත්‍රාපිසීම් ආදිවූ කුදුමහත්කටයුත්තෙහි සමාඪීව ඉදිමියන සිත්ඇතිව වැඩිමහල්ලන්ට සුවච මොලොක්ව පාපිස්නා බිස්සක්සේ මන්නැතිව සතර පසයෙහි ලදදෙයකින් සතුටුව අල්පකෘත්‍යව පරිස්කාර දෑළසකින් වඩා නොනැත්මෙන් සවකියවූ පැවතුම් ඇතිව සන්සුන්ඉඳුරන් ඇතිව මුහුකලනුවණින් යුක්තව කායගව් චම්ගව් නැතිව කුලායා කෙරෙහි නොඇලී කුඩාවූවත් පාපය කුදු නොකොට මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදනුවන් විසින් ලොව්ලොව්තුරු සැප සිඞකටයුතු.

දිනචරියාව නිමි

---

## ස ත ර සං ව ර සී ල ය.

**සීලයනම්**—සතරසංවරසීලය. ගේකෙසේදයත්? ප්‍රාතිමොක්ෂසංවරසීලය, ඉන්ද්‍රියසංවරසීලය, ආජීවපාරිසුද්ධිසීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිතසීලය, යනමේ සතරසංවරසීලයනම්වේ. මෙහි ප්‍රාතිමෝක්ෂ සංවරසීලයනම් චාරිත්‍ර වාරිත්‍ර විසින් දෙකෙක් වේ, මෙහි චාරිත්‍රසීලයනම්, දූගුම් හැමදුම් තණකසල ගැණුම් ගෙජ්තං පත්නං කිරීම් කැලිකසල දූක දූක නොහිඳිම ගිලන් හට මහල්ලන්ට සිල්වත් ගුණවත් හට මෙහෙකිරීම ගුරුන් සිල්වතුන් තුන්වේලේ වැඳිම දෘගැබ් මහබෝ තුන්වේලේ වැඳිම උපන් අහර ඇසුරු ඇති තෙනට බෙදාදී වැලඳිම පුහුණු බණ නොමැලිව පිරවීම හදාරණබණ දන්නාවූන් ලවා කියවාගෙණ කිපරිද්දෙන් පුහුණුකිරීම හැඳිම් පෙරවීම් සකස් කොට හැඳිම පෙරවීම පැනිත්තෙහිද පසද වේලායෙහිද සඤ්ඤිතකාරිය කිරීම යනමේ ආදී වත්පිළිවෙත් චාරිත්‍රසීලය නම්වේ. වාරිත්‍රසීලයනම්, මෙසේ නොකොට සිත් සකායා දස අකුසල කම්මපථාදින් නොකොට දසකුසල කම්මපථ කිරීමය සිල්පිරීමයයි මෙසේ සරිත් වරිත් විසින් දෙකෙක්වූ යේ ප්‍රාතිමොක්ෂසංවර සීලයනම් වේ.

**ඉන්ද්‍රියසංවරසීලය** නම්, රූප ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍ය ධර්මය නමෙ සාරමුණෙහි එලඹ උපදනා ලොභ වෙෂ මොහ නම් ඇති කෙලෙස් සොරුන් කෙරෙන් දුරුව චක්ඛුවාරසොතවාර ඝාණවාර ජිව්හාවාර කායවාර මනොවාර යනමේ සදොරින් නොවැද්දදී සිඟිනම් ඇති දොරපියාලා සිඟිනුවන ඇතිව විසීම ඉන්ද්‍රියසංවරසීලයනම් වේ.

**ආජීවපාරිසුද්ධිසීලය** නම්, කයින් තෙපුලෙන් කරණලද ප්‍රාණි ඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර මුසාවාද පිසුනාවාච ඵරුසා වාච සම්ඵප්‍රලාප යනමේ සතහා කුහණලපනාදින්විසින් තමා කෙරෙහි නැතිගුණ නොපානාදින් කැපසරුප්පරිද්දෙන් දැහැමෙන් සෙමෙන් දිවිපැවැත්වීම, ආජීවපාරිසුද්ධි සීලයනම්වේ. ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලයනම්, දැහැමෙන් සෙමෙන් උපදනාසතර පසයෙහි ලොභ වෙස මොහ දුරුකොට නොමනාමදද බොහොකොට නොඉල්වා සසර කතරගෙවන්නට කාරණායයි සලකා පස්විකා වැලඳිම් පරිභොගකිරිම් ප්‍රත්‍යසන්නිශ්‍රිත සීලයනම්වේ. මෙසේයින් මේ සතර සංවරසීලය සැබැවින් දැන ඉගෙණ සිල්මලසොදා පිරිසිදුසිල් පිරියයුතු.

සබ්බදාසීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො
ආරද්ධවිරියො පහිතත්තො ඔඝංතරතිදුත්තරං.
කාය කම්මංතිධාවුත්තං වාචාකම්මං චතුබ්බිධං
මනසාතිවිධංචෙති දසකම්මපථාඉමෙ.
පාණඝාතපරදබ්බං පරදාරං ච කායතො
මුසාපෙසුඤ්ඤඵරුසා සම්ඵප්පලාපවාචතො
අභිජ්ඣාචෙවව්‍යාපාදො මිච්ඡාදිට්ඨිච මානසො.
වත්තන්තාපරිපූරෙන්තො නසීලංපරිපූරති
අසුද්ධසීලොදුප්පඤ්ඤො දුක්ඛානපරිමුච්චති.
යොගවංනච්ජතිනසොරක්ඛති ගොගණං
එවංසීලංඅජානන්තො කිංසොරක්ඛෙය්‍යසංවරං.

කිකීවඅණ්ඩංචමරීවවාලධිංපියංවපුත්තං නයනංව එකකං
තථෙවසීලං අනුරක්ඛමානකා සුපෙසලාහොථ සදාසගාරවා.

සුලද්ධාවතමෙලද්ධා සද්ධාසුගතසාසනෙ
සීලංමෙයසසකල්‍යාණං පරිසුද්ධමඛණ්ඩිතං.
පාතිමොක්ඛංවිසොධෙන්තා අප්පෙවජීවිතං ජහෙ
පඤ්ඤත්තංලොකනාථෙන නභින්දෙසීලසංවරං.
ඉමංහි සීලරතනං ඉධචෙවපරත්ථච
ආනිසංසවරෙදත්වා පච්ඡාපපෙපානති නිබ්බුතිං.

**චතුපාරිසුද්ධිසීලය නිමි.**

# දැන්වීමයි.

අපතථාගත සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ සකල ලොක සත්වයා කෙරෙහි පතලාවූ මහාකරුණාවෙන් සාරාසඞ්ඛ්‍යෙය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දානාදි දසපාරමී ධර්මයන් පුරා අපරාජිත මාරපර්‍ය්‍යඞ්කයට පැමිණ පස්මරුන් බිඳ ජයගෙණ දුක්ඛ සමුදය නිරොධමාර්ග යන චතුරාර්‍ය්‍ය සත්‍යධර්මයන් මනාකොට අවබොධ කිරීමෙන් දසදහසක් සක්වල එකහෙලා කම්පාකරවමින් සර්වඥතාඥානයට පැමිණ පන්සාළිස්අවුරුද්දක් මුළුල්ලෙහි ලෝ වැඩසිට වෛනෙය්‍යජනයන් සංසාරබන්ධනයෙන් මුදා නිර්වාණක්‍ෂෙම භූමියට පමුනුවන පිණිස දෙසනා කරණලද ධර්ම විනයන් අතුරෙන් විනයධර්මය තමන්වහන්සේගේ ඖරසපුත්‍ර භික්‍ෂූන්ට හිතපිණිස දෙසනා කලසේක.

මෙම ධර්මය ආපත්තිස්කන්ධවශයෙන් සතක් වන්නාහ, එයින් පාරාජිකාපත්තිස්කන්ධය වනාහි සත්වයාට මහාපෘථිවියමෙන් සර්වඥශාසනය පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි ධරන්නේවෙයි. මෙසේ ශාසන චිරස්ථිතියට මුල්වූ (මෙම ධර්මයාගේ හෙවත්) සතරපාරාජිකාපත්තීන්ගේ විස්තර විභාගය නොදත් භික්‍ෂූන්ට එය රක්‍ෂාකරගැණීම තීක්‍ෂණයෙන් කටයුතුහෙයින් ඉතා නුපුළුවන්මය, තවද ගෘහස්ථ ප්‍රතිපත්තිය පාලනය කරණ උපාසක උපාසිකාවන් නිත්‍ය පඤ්චසීලයහා පොහොය අෂ්ටාඞ්ගසීලය රක්‍ෂාකරත් මුත් ප්‍රාණඝාතයෙහි හා අදත්තාදානයෙහි විස්තරවිභාග නොදත් අයට එය සම්පූර්ණ කිරීම නුපුළුවන්මය. එබැවින් ගෘහස්ථ ප්‍රව්‍රජිත උභයපක්‍ෂයම නිත්‍යාදරයෙන් භාවිතා කටයුතු මෙමධර්මයන් ප්‍රකාසිත සිංහල අර්ථව්‍යාඛ්‍යාණ කුඩා පොත්පත් ඉතා දුර්ලභහෙයින් අධුනාගත නවකභික්‍ෂු සාමණෙරයන්වහන්සේලාට සහ උපාසක උපාසිකාවන්ටත් පැමිණි තිබෙන පාඩුව පිරිමැසීම පිණිස මෙබඳු ග්‍රන්ථයක් සංග්‍රහකොට මුද්‍රණයකරවා බෙදා දුන්නේ වීනම් ඉතා උතුම් ශාසනසංග්‍රහයක් වන්නේයයි මට වැටහුනු හෙයින් මෙම “සතරපාරාජිකා විනිශ්චය” නම් ග්‍රන්ථය එක්තරා ස්වාමීන්වහන්සේනමක් ලවා සංග්‍රහකරවාගෙණ ශාසනාලය පෙරදැරිකරගෙණ බොහෝ වෙහෙසමහන්සිදරා මුදල්

රුසක් වියදම්කොට මුද්‍රනය කරවා ප්‍රසිද්ධ කෙලෙමි මෙහි ප්‍රමාදාදී දෝෂ ඇතත් බොහෝ මහන්සිදරා මෙය සංග්‍රහකොට දුන් ස්වාමීන්වහන්සේට සහ මහත් උත්සාහයෙන් මුදල් රුසක් වියදන්කොට මුද්‍රනයකරවා තමුන්නාන්සේලා අතට පත්කල මාකෙරෙහිත් අනුකම්පා කරමින් පණ්ඩිතයන්වහන්සේලාකරා පැමිණ එය අසාබලා නිදෝස්ලෙස භාවිතා කිරීමෙන් දැන ඉගෙණ ශාසනප්‍රතිපත්තිය සම්පූර්ණකොට සග මොක්සැප ලැබීමට උත්සාහ කටයුතුයි.

---

මෙමපොත නැවත මුද්‍රනයකිරීමේ අයිතිවාසිකම මටම තබා ගත්තා පමණක්නොව මගේ සිල්එක නැති පොතක් සම්භාවී නම් නඩුමාර්ගයට ගෙණයන බව මෙයින් දැනුම්දෙමි.


ඇම්. දියෝනිස්ප්‍රනාන්දු
M. D. Pernando

වර්‍ෂ 1897 ක්වූ අප්‍රේල්මස
15 වෙනි දිනදීය.

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 14 | අවතාරෙසු | අවහාරෙසු |
| 3 | 5 | ආනනනකඛණෙ | ආනනනිකඛණෙ |
| ,, | 8 | පුබබයෙව | පුබෙබයෙව |
| 5 | 30 | ආනතනකඛණෙ | ආනත්තිකඛණෙ |
| 6 | 2 | දුඝඝටං | දුකකටං |
| 7 | 15 | සකලලොකසත්වයා | සකලසත්වයා |
| ,, | 16 | දෙසනා | දෙශනා |
| ,, | 18 | ආපත්තිස්කඳු | ආපත්තිස්කන්ධ |
| 8 | 1 | මෙවුල්දම් | මෙවුන්දම් |
| ,, | 20 | ප්‍රවෙසනය | ප්‍රවෙශය |
| 10 | 24 | යනදෙය | යම්දෙය |
| 11 | 16 | සැරීම් | උමන්සැරීම් |
| ,, | 20 | පැහැරගණ්ණාවුන් | පැහැරගණ්ණාවූ චෞරවාදී- |
| ,, | 21 | රාජබැලයන් | ගාමභොජකරාජබැලයන් (න් |
| ,, | 28 | ගණ්ණෙමි | ගණ්ණාමියි |
| 13 | 28 | උද්දිස්සනොද්දිස්ස | උද්දිස්සානුද්දිස්ස |
| 14 | 13 | උද්දිස්සානොද්දිස්ස | උද්දිස්සානුද්දිස්ස |
| 15 | 29 | රන්රිදී | රණ්රිදී |
| 16 | 3 | මෙවුම්දම් | මෙවුන්දම් |
| ,, | 18 | රන් | රණ් |
| 16 | 1 | ආකොසාපරිකොසා- | අකෝසාපරිකෝසා |
| ,, | 26 | රන් | රණ් |
| ,, | 29 | ආවාසාය | අවාසාය |
| ,, | 33 | විවෙක | විවෙකස්ථානයක හිඳ සීල්බැලීමෙන් විවෙක |
| 16 | 28 | කඛුෂිනං | භිකඛුනං |
| 19 | 28 | තරීයථා | තරීරථා |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු